**ශීර්ෂය 130 - පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය**

**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

**විගණන විෂය පථය**

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 සැප්තැම්බර් 11 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන නිරීක්ෂණය**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) හා (ආ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) විසර්ජන ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුළු ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.4,760,914,770 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.3,179,374,946 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.1,581,539,824 ක් හෙවත් සියයට 33 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2013 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 249,284,770 | 229,846,949 | 19,437,821 | 8 |
| මුලධන | 4,511,630,000 | 2,949,527,997 | 1,562,102,003 | 35 |
| එකතුව | 4,760,914,770 | 3,179,374,946 | 1,581,539,824 | 33 |

**(ii). අයවැය විචලනය**

පහත සඳහන් විචලනයන් අනාවරණය විය.

- වැය විෂයයන් 07 ක් සඳහා සළසා තිබුණු රු.189,753,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.
- වැය විෂයයන් 30 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6 සිට සියයට 97 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ආ). රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **විෂය අංකය** | **වියදම** | | **ලැබීම** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|---|
| | **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| | **රු.** | **රු.** | **රු.** | **රු.** | **රු.** | **රු.** |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 13001 | 8,000,000 | 7,284,765 | 4,000,000 | 5,229,486 | 35,000,000 | 24,611,862 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විෂය අංක 13001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.557,197 ක් විය. හිඟහිටි ශේෂය තුළ වසර 3 සිට වසර 4 ක කාලයක සිට පැවැත එන වැඩ තහනමට ලක්ව සිටි නිලධාරියකුගේ රු.143,200 ක ණය ශේෂය අය කර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

## 1.4 වත්කම් කළමණාකරණය

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර 2014 මාර්තු 31 දිනට ප්‍රථම එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් එම වාර්තා 2014 ජුනි 09 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

## 1.5 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛය** | |
| 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන චක්‍රලේඛය<br>(i) 3.1 ඡේදය | ඇමතිවරුන්ගේ පරිහරණය සඳහා හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් වෙන් කළ හැකි උපරිම වාහන සංඛ්‍යාව 03 ක් වුවත්, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ පරිහරණය සඳහා හා ආරක්ෂක කටයුතු සඳහා අමාත්‍යවරයාට වාහන හතක් හා නියෝජ්‍ය අමාත්‍යවරයාට වාහන |

| | |
|---|---|
| | තුනක් වැඩියෙන් වෙන්කර තිබුණි. |
| (ii) 2.1 ඡේදය | අනුමත කාර්ය මණ්ඩලය යටතේ රියදුරන් දෙදෙනෙකු පමණක් සේවයේ යොදාගත හැකි වුවද ඇමතිවරයා සඳහා රියදුරන් පස් දෙනෙක් ද නියෝජ්‍ය ආමාත්‍යවරයා සඳහා රියදුරන් තිදෙනෙකු ද වෙන් කරගෙන තිබුණි. |

## 1.6 අරමුණු වලට පටහැනි වියදම්

නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් අරමුණුවලට පටහැනි වියදම් අනාවරණය විය.

(i) 2013 සැප්තැම්බර් 09 දින සිට 15 දින දක්වා නම් කර තිබූ පළාත් පාලන සතිය වෙනුවෙන් වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් රු.5,000,000 ක ප්‍රතිපාදන සළසා තිබුණත්, එම ප්‍රතිපාදනවලින් රු.4,977,262 ක් වැය කර 2012 පළාත් පාලන සමුළුව පවත්වා තිබුණි. පළාත් පාලන සතිය වෙනුවෙන් කිසිදු මුදලක් වැයකර නොතිබුණි.

(ii) පළාත් පාලන ආයතනවල තොරතුරු ඇතුළත් දත්ත පද්ධතිය ස්ථාපිත කිරීමට 2013 වර්ෂයේ සළසා තිබූ රු.5,000,000 ක ප්‍රතිපාදනවලින් රු.4,032,285 ක් වැය කර යන්ත්‍ර සහ උපකරණ මිලදී ගෙන එක් එක් අංශවලට බෙදා දී තිබුණි.

## 1.7 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2013 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත දැක්වේ .

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 27 | 25 | 02 | - |
| (ii) | තෘතියික මට්ටම | 04 | 03 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 137 | 108 | 29 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 54 | 38 | 16 | - |
| | වෙනත් (අනියම්/ තාවකාලික/කොන්ත්‍රාත්) | - | 12 | - | 12 |
| | එකතුව | 222 | 186 | 48 | 12 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

පුරප්පාඩු 48 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.